AL/2024/45/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

බෞද්ධ ශිෂ්ටාචාරය I
பௌத்த நாகரிகம் I
Buddhist Civilization I

**45 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

- ※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ※ පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- ※ පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- ※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **ඉතාමත් ගැළපෙන** පිළිතුර තෝරාගෙන එය **පිළිතුරු පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

**1.** බ්‍රාහ්මණ සම්ප්‍රදායට අයත් ප්‍රමුඛ ඉගැන්වීමක් වූ ආපද් ධර්ම හා සම්බන්ධ පහත සඳහන් ප්‍රකාශ හොඳින් කියවන්න.

A - ශුද්‍රයාට ආපද් ධර්ම අහිමි විය.
B - ආපද් ධර්ම දේව නිර්මාණවාදී බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීමකි.
C - ආපද් ධර්ම මගින් පහළ කුලවල අයට ඉහළ කුලවලට අයත් රැකියාවල නියැලීමට අවස්ථාව ලැබුණි.
D - ආපදාපන්න අවස්ථාවලදී බමුණෝ සමාජයේ යහ පැවැත්ම වෙනුවෙන් පෙරමුණ ගෙන කටයුතු කළහ.
E - ආපද් ධර්ම ක්‍රියාත්මක කිරීමේ බලය ක්ෂත්‍රියන්ට පවරා තිබුණි.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් ආපද් ධර්ම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ C (4) B සහ D (5) B සහ E

**2.** බුද්ධකාලීන භාරතීය සමාජය ක්‍රමයෙන් වාණිජකරණයට හා නාගරීකරණයට නතු වූ බව තහවුරු කෙරෙන සාධක රැසක් හඳුනාගත හැකි ය. පහත සඳහන් ප්‍රකාශ අතර ඒ හා සම්බන්ධ සාධක කිහිපයක් අන්තර්ගත ය.

A - වෙළෙඳුන් වෘත්තීය වශයෙන් සංවිධානය වීම
B - මුදල් භාවිතයට පැමිණීම
C - වෙළඳ නගර බිහිවීම
D - කෘෂිකර්මාන්තය ජීවනෝපාය වීම
E - අන්තර්ජාතික මාර්ග පද්ධතියක් බිහිවීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් බුද්ධකාලීන භාරතීය සමාජය වාණිජකරණයට හා නාගරීකරණයට නතු වූ බව තහවුරු කෙරෙන සාධක තුනක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A, B සහ C (2) A, B සහ D (3) A, C සහ D
(4) B, C සහ D (5) C, D සහ E

**3.** "පෘථිවියේ සියලු ප්‍රාණීන් මරා එක ම මස් ගොඩක් කළ ද ඒ හේතුවෙන් උපදනා පාපයක් නැතැ"යි ඉගැන්වූ බුද්ධකාලීන ආගමික ශාස්තෘවරයා වූයේ,

(1) අජිත කේසකම්බලී ය. (2) පූරණ කස්සප ය. (3) මක්ඛලී ගෝසාල ය.
(4) පකුධ කච්චායන ය. (5) සංජය බෙල්ලට්ඨිපුත්ත ය.

**4.** බුද්ධකාලීන භාරතීය දේශපාලන තොරතුරු ගවේෂණයේදී ප්‍රකට ව පෙනෙන වැදගත් සංකල්පයක් ලෙස "මත්ස්‍ය න්‍යාය" හඳුනාගත හැකි ය. එය

(1) රටවැසියන් පාලනය කිරීමේ ක්‍රමවේදය හා සම්බන්ධ න්‍යායකි.
(2) රාජ්‍යයක සම්පත් බෙදී යායුතු ආකාරය පිළිබඳ න්‍යායකි.
(3) මහාරාජ්‍යයන්ගේ දේශසීමා පුළුල් කර ගැනීමට ක්‍රියාත්මක කරන ලද න්‍යායකි.
(4) අසල්වැසි රාජ්‍යයන් හා සුහද ව කටයුතු කිරීම පිළිබඳ න්‍යායකි.
(5) කුඩා රාජ්‍යයන්ගේ දේශසීමා පුළුල් කර ගැනීමට ක්‍රියාත්මක කරන ලද න්‍යායකි.

[දෙවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

5. බ්‍රාහ්මණ ආගමික ඉගැන්වීම් අනුව වානප්‍රස්ථ ආශ්‍රමයේදී තවුස්දම් රැකීම සඳහා වනගත වන විට සිය අභිමතය පරිදි බිරිඳ ද කැටුව යා හැකි විය. එම අනුමැතිය ලැබුණේ,
(1) බ්‍රාහ්මණ වර්ණයට පමණි.
(2) බ්‍රාහ්මණ හා ක්ෂත්‍රිය වර්ණ දෙකට පමණි.
(3) ක්ෂත්‍රිය හා වෛශ්‍ය වර්ණ දෙකට පමණි.
(4) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය හා වෛශ්‍ය වර්ණ තුනට පමණි.
(5) බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර වර්ණ හතරටම ය.

6. බුදුසසුනේ අගසව් තනතුරු ලැබූ සැරියුත් මුගලන් දෙනම බුදුරදුන්ගේ ශ්‍රාවකයන් වීමට පෙර අයත් ව සිටියේ ........................ ආගමික සම්ප්‍රදායට ය.
(1) ජෛන (2) ජටිල (3) පරිබ්‍රාජක (4) ආජීවක (5) අචේලක

7. පහත සඳහන් ප්‍රකාශ හොඳින් කියවන්න.
A - සියලු සැප දුක් පෙර කරන ලද කර්මයට අනුව සිදු වේ.
B - දුකින් නිදහස් වීම සඳහා පෙර කරන ලද කර්ම ගෙවා දැමිය යුතු අතර නව කර්ම නො කළ යුතු ය.
C - කාය දණ්ඩය වඩාත් ප්‍රබල වේ.
D - සියලු ඇල්දියෙන් වැළකීම උසස් ශීලයකි.
E - නිත්‍ය වූ ආත්මයක් ඇත.
ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් නිගණ්ඨනාතපුත්ත ආචාර්යවරයාගේ ඉගැන්වීම් වැඩි ම ප්‍රමාණයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) A, B සහ C (2) A, B සහ D (3) A, B, C සහ D
(4) A, B, C සහ E (5) A, B, C, D සහ E යන සියල්ල ම

8. හිස්තැනට වඩාත් සුදුසු වාක්‍යය තෝරන්න.
බුද්ධකාලීන ශ්‍රමණ සම්ප්‍රදායට ඇතුළත් ජටිලයෝ ........................ .
(1) අතින් දණ්ඩක් ගෙන සිටි අතර, අත්තකිලමථානුයෝගී ව උග්‍ර තපස් ව්‍රත අනුගමනය කළහ.
(2) තමා කෙලෙස් ගැටවලින් තොර යැයි කියා සිටියහ.
(3) ගිනි දෙවියන් පිදීමට හා උදක පාරිශුද්ධියට ප්‍රමුඛතාවක් ලබාදුන්හ.
(4) සන්සුන් ඉඳුරන් ඇති කසාවත් දරන සංවර පිරිසක් වූහ.
(5) ශ්වේතාම්බර හා දිගම්බර යනුවෙන් දෙපිරිසක් ලෙස උග්‍ර තපස් ව්‍රත අනුගමනය කළහ.

9. බඹ සුර යකුන් තද
දමනය කර තමන් ලද
සෙත් දී මුනිඳු සඳ
.............................. ............
ඉහත සඳහන් කවියෙන් විස්තර වන බුදුගුණය නම් කරන්න.
(1) විජ්ජාචරණ සම්පන්න (2) පුරිසදම්මසාරථී (3) භගවා
(4) ලෝකවිදූ (5) සත්ථා

10. "බුදුරජාණන් වහන්සේ ලෞකික ආශා නමැති ගිනිගත් නිවස තුළ දැවෙන දරුවන් බේරා ගැනීමට මාර්ග යොදන්නා වූත්, බේරා ගැනීමෙන් පසු නිර්වාණය නමැති ආරක්ෂක ස්ථානයට මග පෙන්වන්නා වූත් පියකු බඳු ය."
බුදුරජාණන් වහන්සේ පිළිබඳ මෙම ඇගයීම සිදුකරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) මහාචාර්ය ලක්ෂ්මී නරසු (2) මහාචාර්ය සොණ්ඩර්ස්
(3) එඩ්වින් ආර්නෝල්ඩ් (4) ඇල්බට් අයින්ස්ටයින්
(5) මැක්ස් මුලර්

11. "ඵුට්ඨස්ස ලෝක ධම්මේහි චිත්තං යස්ස න කම්පති" යන මංගල සූත්‍රාගත ප්‍රකාශයෙන් ප්‍රකට කෙරෙන මංගල කරුණ බුදුරජාණන් වහන්සේගේ .............................. සමාන වේ.
(1) පද්මාකාර ජීවිතයට (2) අරහං බුදුගුණයට (3) මහා ප්‍රඥාවට
(4) මහා කරුණාවට (5) තාදී ගුණයට

[තුන්වැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**12.** පහත දැක්වෙන්නේ විශාඛා මහෝපාසිකාවගේ හා නකුලමාතාවගේ චරිත කථාවලට අදාළ ප්‍රකාශ පහකි.

A - අගතනතුරු ලබා තිබීම
B - ස්වාමියාගේ පියාණන්ට ධර්මාවබෝධය සඳහා මගපෙන්වීම
C - සොළොස්වසක් තිස්සේ ගෘහස්ථ බ්‍රහ්මචරියාව පිරීම
D - ආරාම තනා බුදුරදුන්ට පූජා කිරීම
E - මාර්ගඵලවලට පත් වී සිටීම

ඉහත ප්‍රකාශ අතුරින් විශාඛා මහෝපාසිකාවගේ හා නකුලමාතාවගේ චරිත කථාවලට පොදු වූ ප්‍රකාශ දෙක පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A සහ B (2) A සහ C (3) A සහ D (4) A සහ E (5) B සහ C

**13.** පහත දැක්වෙන්නේ බුද්ධකාලීන ආගමික හා දාර්ශනික පසුබිම තුළ ප්‍රකට ව පැවති ඉගැන්වීම් කිහිපයකි.

A - දේව නිර්මාණවාදය
B - නියතිවාදය
C - පුබ්බේකතහේතුවාදය
D - අධිච්චසමුප්පන්නවාදය
E - අමරාවික්ඛේපවාදය

සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා විකාශය පිළිබඳ අග්ගඤ්ඤ සූත්‍රාගත විවරණයෙන් ප්‍රතික්ෂේප වන බ්‍රාහ්මණ ඉගැන්වීම ඇතුළත් වරණය වන්නේ කුමක් ද?

(1) A (2) B (3) C (4) D (5) E

**14.** බුදුදහම කම්මවාදී, කිරියවාදී, විරියවාදී ධර්මයකි. එබැවින් පුද්ගලයා විසින් සචේතනික ව සිදුකරනු ලබන හොඳ-නරක ක්‍රියාවල විපාකය කර්තෘ විසින් ම දැරිය යුතුබව බුදුසමයේ ස්ථාවරයයි. සචේතනික ක්‍රියාවේ විපාකය කර්තෘ වෙත පැවරෙන බැවින් ක්‍රියාව කරන්නාට ඒ සඳහා ............................ පවත්නා බව බුදුසමයේ පිළිගැනීමයි.

(1) ස්වච්ඡන්දතාවක් (2) විපාකයක් (3) විනිශ්චයක්
(4) උත්තේජනයක් (5) අධිෂ්ඨානයක්

**15.** පාලන තන්ත්‍රයේ යහපැවැත්ම පිණිස පාලකයා විසින් අනුගමනය කළයුතු දේශපාලන මූලධර්ම රැසක් බෞද්ධ දේශපාලන දර්ශනයේ අන්තර්ගත වේ. එහෙත් ඇතැම් පාලකයෝ තම ඥාතීන්ට හා හිතවතුන්ට පක්ෂග්‍රාහී ව කටයුතු කිරීමෙන් හා විරුද්ධවාදීන්ගෙන් පළි ගනිමින් වෛර සහගත ව කටයුතු කිරීමෙන් රාජ්‍යය හා ජනතාව පරිහානියට පත් කරති. මෙවැනි තත්ත්වයක් ඇතිවීමට වඩාත් ම බලපෑ හැකි හේතුව ලෙස හඳුනාගත හැක්කේ පාලකයන්

(1) සතර සංග්‍රහ වස්තු අනුගමනය නො කිරීමයි.
(2) පඤ්චශීල ප්‍රතිපදාව අනුගමනය නො කිරීමයි.
(3) ලෝකපාලන ධර්ම අනුව කටයුතු නො කිරීමයි.
(4) සප්ත අපරිහානිය ධර්ම අනුගමනය නො කිරීමයි.
(5) සතර අගතියෙන් අගතියට යාමයි.

**16.** බෞද්ධ දේශපාලන සිද්ධාන්ත අනුව පාලකයන් මහජනතාවගේ ප්‍රශ්න හා දුක් පීඩාවන් පිළිබඳ සංවේදී ව හා නම්‍යශීලී ව ක්‍රියා කළ යුතු ය. දශ රාජධර්ම අතර මෙම අදහස ඇතුළත් රාජධර්මය ලෙස හඳුනාගත හැක්කේ,

(1) ඉවසීමයි. (2) පරිත්‍යාගයයි. (3) මෘදුබවයි.
(4) ඍජුබවයි. (5) විරෝධාකල්ප නො දැරීමයි.

**17.** රාජ්‍ය පාලනයට අදාළ බෞද්ධ මූලාශ්‍රයාගත අදහස් ඇතුළත් පහත සඳහන් ප්‍රකාශ කියවන්න.

A - දරිද්‍රතාවෙන් පීඩා විඳින ජනතාවට යහපත් ආර්ථිකයක් ගොඩනගා ගැනීමට අනුග්‍රහ දැක්විය යුතු ය.
B - තම රටෙහි වෙසෙන උගත් මහණ බමුණන්ගේ අවවාද අනුශාසනා ලබාගත යුතු ය.
C - වැඩිහිටියන්ට ගරු බුහුමන් කළයුතු අතර ඔවුන්ගේ වචනවලට සවන් දියයුතු ය.
D - රට තුළ උද්ගත වන අපරාධ මර්දනය කොට ජනතාවට බියෙන් තොර ව ජීවත්වීමට අවශ්‍ය පරිසරය සකස් කළයුතු ය.
E - ඒ ඒ ක්ෂේත්‍රවල දක්ෂතා හා හැකියාව ඇති පිරිස් හඳුනාගෙන අවශ්‍ය ප්‍රාග්ධනය, වැටුප්, ආහාර, යටිතල පහසුකම් ආදිය සැපයීමෙන් රටවැසියන්ගේ ආර්ථිකය නගා සිටුවිය යුතු ය.

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් දස සක්විතිවත්වලට ඇතුළත් **නො වන** ප්‍රකාශ දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) A සහ D (4) B සහ E (5) C සහ E

[හතරවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**18.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් හොඳ-නරක ක්‍රියා විනිශ්චයෙහිලා යොදා ගැනෙන නිර්ණායකයක් ලෙස **නො සැලකිය** හැකි ප්‍රකාශය තෝරන්න.

(1) තමා උපමා කොට ප්‍රාණඝාතාදී පාපක්‍රියාවලින් වැළකිය යුතු ය.
(2) පරලොව යන පුද්ගලයන්ට පිහිටට පැමිණෙන්නේ පින බැවින් පිංකම් කළයුතු ය.
(3) විපාකය දුක් සහගත වේ නම් එබඳු ක්‍රියා සිදුකිරීමෙන් වැළකිය යුතු ය.
(4) කැඩපතකින් තම සිරුර නිරීක්ෂණය කරන්නා සේ කායික, වාචික හා මානසික ක්‍රියා ප්‍රත්‍යවේක්ෂා කළයුතු ය.
(5) රාග, ද්වේෂ, මෝහ සහගත ක්‍රියා පාප ක්‍රියා ලෙස තීරණය කළයුතු ය.

**19.** "වෙසක් පොහෝ දින ගමේ විහාරස්ථානයට පැමිණි උපාසක උපාසිකාවෝ පෙහෙවස් සමාදන් වීමෙන් අනතුරුව ගාථා සජ්ඣායනය කරමින් උදෑසන ආහාර බුද්ධපූජාව පැවැත්වූහ. සියලු ලෝ සතුන් වෙත මෙත් සිත පතුරවමින් මෛත්‍රී භාවනාවේ යෙදුණු සිල්වත් පිරිස ධර්ම දේශනාවට සවන් දුන්නේ කර්ම ඵල විශ්වාසය පිළිබඳ සම්‍යග් දෘෂ්ටියෙහි පිහිටා ය."

ඉහත සඳහන් ප්‍රකාශය තුළ දශපුණ්‍යක්‍රියාවලින් කොපමණ ප්‍රමාණයක් අන්තර්ගත වේ ද?

(1) දෙකක් (2) තුනක් (3) හතරක් (4) පහක් (5) හයක්

**20.** රිය සකට කඩ ඇණයක් නැති කල්හි රථයට ගමනක් නැත. කඩ ඇණය ඇති කල්හි ම රියෙහි මනා ගමනය සිදු වේ. එපරිද්දෙන් සමාජයක් යහපත් ආකාරයෙන් පැවතීමට අවශ්‍ය සාධක හතරක් බෞද්ධ ඉගැන්වීම්වල ඇතුළත් වේ. ඒවා ............................ නමින් හැඳින්වේ.

(1) සතර බ්‍රහ්ම විහරණ
(2) සතර සංග්‍රහවස්තු
(3) සතර අගති විරති
(4) සතර කර්මක්ලේෂ
(5) සතර සතිපට්ඨාන

**21.** ගෘහස්ථ ජීවිතයේ ආචාර ධර්ම පිළිබඳ මෙන් ම ගිහියාගේ ආර්ථික කටයුතු පිළිබඳ ව ද වටිනා සදුපදේශයන් අන්තර්ගත සූත්‍රයක් ලෙස සිගාලෝවාද සූත්‍රය හඳුනා ගතහැකි ය. එහි දැක්වෙන 'ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය...' යනාදි ගාථාවෙන් පැහැදිලි වන්නේ ............................ පිළිබඳ උපදේශයකි.

(1) ධනෝපායනය
(2) ධන කළමනාකරණය
(3) ධන සංරක්ෂණය
(4) ධන ආයෝජනය
(5) ධන පරිභෝජනය

**22.** බුදුසමය අනුදත් පරිභෝජන දර්ශනයෙහි එන සංකල්ප අතුරින් 'නිස්සරණ පඤ්ඤෝ' යන්නෙන් අදහස් කර ඇත්තේ,

(1) 'ගැති නො වී ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.
(2) 'මූර්ඡා නො වී ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.
(3) 'ආදීනව දකිමින් ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.
(4) 'අත්හැරීමේ නුවණින් යුතු ව ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.
(5) 'දැඩි උපාදානයෙන් තොර ව ධනය පරිහරණය කළයුතු ය' යන්නයි.

**23.** පරිසර සංරක්ෂණය පිළිබඳ ඉතා වැදගත් තොරතුරු ඇතුළත් සංයුත්තනිකායේ වනරෝප සූත්‍රයෙහි දිවා රෑ පිං වැඩෙන පරිසර හිතකාමී කටයුතු කිහිපයක් දක්වා තිබේ. පහත සඳහන් වරණ අතුරින් එම සූත්‍රයෙහි සඳහන් **නො වන** පිංකමක් වන්නේ,

(1) අම්බලම් ඉදිකිරීමයි.
(2) වනාන්තර වැවීමයි.
(3) පාලම් ඒ දඬු තැනීමයි.
(4) පැන් පොකුණු තැනීමයි.
(5) මංමාවත් තැනීමයි.

**24.** බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ හඳුන්වා දීමේදී මඩෙන් ඉස්මතු ව ප්‍රබුද්ධ වන නෙළුම මඩෙහි යළි නො ගැටී, පවිත්‍ර ව සුවඳවත් ව තිබෙන්නාක් මෙන්, තමන් ද කිලිටි වූ කාමභෝගී ජන සමාජයෙහි ඉපිද, ඉන් ඉස්මතු ව ශ්‍රේෂ්ඨ වූ සම්බුද්ධත්වයට පත් වූ බව දැක්වෙන උපමාවෙන් නිරූපණය වන්නේ උන්වහන්සේගේ

(1) පද්මාකාර ජීවිතයයි.
(2) තාදී ගුණයයි.
(3) පරමාදර්ශීබවයි.
(4) පරාර්ථකාමීත්වයයි.
(5) පරිසර හිතකාමීත්වයයි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**25.** පහත සඳහන් ප්‍රකාශ අවධානයෙන් කියවන්න.

A - බුදුසසුන තුළ පැවැති විෂමතා දුරලීමට කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේදී ධර්ම සංගායනාවක් පැවැත්වීම
B - එම සංගායනාව අවසානයේදී විභාෂා නමින් අටුවා ග්‍රන්ථ සම්පාදනය කිරීම
C - සංගායිත ධර්මය තඹපත්වල ලියා මඤ්ජුසාවක බහා ස්තූපයක තැන්පත් කිරීම
D - සංගායනාවෙන් අනතුරුව මධ්‍යාසියාව කේන්ද්‍රකර ගනිමින් ධර්ම ප්‍රචාරක වැඩ පිළිවෙළක් ඇරඹීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් කණිෂ්ක රජතුමාගේ අනුග්‍රහයෙන් පවත්වන ලද සිවුවන ධර්ම සංගායනාවට අදාළ වැඩි ම කරුණු ගණනක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A, B සහ C (3) A, B සහ D
(4) B, C සහ D (5) A, B, C සහ D

**26.** ඒ ඒ දිශාවන්ට අයත් පුද්ගලයන් විසින් ඉටු කළයුතු යුතුකම් හා වගකීම් හැට එකක් සිගාලෝවාද සූත්‍රයේ ඇතුළත් වේ. ඉන් පහක් පහත දැක් වේ.

A - කල්‍යාණෙන මනසා අනුකම්පති - යහපත් සිතින් අනුකම්පා කිරීමෙන්
B - පාපා නිවාරෙන්ති - පවින් වැළැක්වීමෙන්
C - සිප්පං සික්ඛාපෙන්ති - ශිල්පීය ඥානය ලබාදීමෙන්
D - කල්‍යාණෙ නිවේසෙන්ති - යහපතෙහි යෙදවීමෙන්
E - සුවිනීතං විනෙන්ති - මනාව හික්මවාලීමෙන්

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් දෙමාපියන් හා මහණ බමුණන් යන දෙපක්ෂයේ ම යුතුකමක් වන්නේ කුමක් ද?

(1) A (2) B (3) C (4) D (5) E

**27.** පිරිහීමේ දොරටුවක් ලෙස පරාභව සූත්‍රයෙහි ඇතුළත් **නො වන** කරුණ වන්නේ,

(1) නින්දේ ඇලීමයි. (2) පිරිස් සමග කාලය ගතකිරීමයි.
(3) සතර අගතියෙන් අගතියට යාමයි. (4) අලසබවයි.
(5) නිතර කිපෙන සුළුබවයි.

**28.** පහත සඳහන් කරුණු අතුරින් මංගල සූත්‍රයෙහි ඇතුළත් මංගල කරුණක් වන්නේ,

(1) අල්ප කෘත්‍ය ඇති බවයි.
(2) සැහැල්ලු පැවතුම් ඇති බවයි.
(3) පෙර කළ පිං ඇති බවයි.
(4) ශාන්ත වූ ඉන්ද්‍රියන් ඇති බවයි.
(5) අනතිමානී බවයි.

**29.** අත්තානං චේ පියං ජඤ්ඤා
රක්ඛෙය්‍ය නං සුරක්ඛිතං
තිණ්ණමඤ්ඤතරං යාමං
........................................

මෙම ධම්මපද ගාථාවේ හිස්තැනට සුදුසු පදය තෝරන්න.

(1) තං වෙ පරම දුක්කරං (2) පටිජග්ගෙය්‍ය පණ්ඩිතො
(3) පුරාණානි අනුත්ථුනං (4) වජිරං'වස්මමයං මණිං
(5) සෙය්‍යො හොති න පාපියො

**30.** පළමු ධර්ම සංගායනාවේදී ගනු ලැබූ තීරණයකට අනුව ධර්මධර හා විනයධර මහතෙරවරුන් ප්‍රධාන උන්වහන්සේලාගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවලට ධර්ම විනය කටපාඩමින් පවත්වාගෙන යාමට පවරන ලදී. එම තීරණයට අනුව අංගුත්තර නිකාය කටපාඩමින් පවත්වාගෙන යාමට පවරන ලද්දේ,

(1) ආනන්ද මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.
(2) සැරියුත් මහරහතන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.
(3) මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.
(4) උපාලි මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.
(5) අනුරුද්ධ මහරහතන් වහන්සේ ප්‍රමුඛ ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවටයි.

[හයවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**31.** පළමු ධර්ම සංගායනාව පිළිබඳ චුල්ලවග්ග පාළියේ සඳහන් විස්තරයට අනුව මහාකාශ්‍යප හිමියන් සංගායනාව පැවැත්වීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරමින් සංගීතිකාරක භික්ෂූන් හමුවේ කරන ලද ප්‍රකාශය වන්නේ,
(1) "අනාගතයෙහි අධර්මය හා අවිනය ප්‍රබල වී ධර්මය හා විනය දුර්වල වේ" යන්නයි.
(2) "අනාගතයෙහි ධර්මය හා විනය ප්‍රබල වී අධර්මය හා අවිනය දුර්වල වේ" යන්නයි.
(3) "අනාගතයෙහි අධර්මවාදීන් හා අවිනයවාදීන් දුර්වල වී ධර්මවාදීන් හා විනයවාදීන් ප්‍රබල වේ" යන්නයි.
(4) "අනාගතයෙහි ශාසනය තුළ ධර්ම විනය සම්බන්ධයෙන් බරපතල ගැටලු ඇති වේ" යන්නයි.
(5) "සංගායනාවෙන් ශාසනය පිරිසිදු වන බැවින් අනාගතයෙහි ධර්ම විනය සම්බන්ධයෙන් ගැටලු ඇති නො වේ" යන්නයි.

**32.** ප්‍රථම ධර්ම සංගායනාවේදී මුලින් විනය සංගායනා කිරීමට තීරණය කෙළේ
(1) 'මුලින් ම විනය සංගායනා කළ යුතු යැ'යි බුද්ධ නියමයක් පැවති නිසා ය.
(2) විනයධර භික්ෂූන්ගේ බලපෑම ප්‍රබල වූ නිසා ය.
(3) 'ධර්මයට වඩා විනය උසස් යැ'යි සම්මතයක් පැවති නිසා ය.
(4) විනය වනාහි ශාසනයේ ආයුෂ ලෙස සැලකූ නිසා ය.
(5) ශාසනය තුළ විනය පිරිහී පැවති නිසා ය.

**33.** 'දුසිල් භික්ෂූන් සමග විනය කර්ම කළ නො හැකි යැ'යි ධර්මාශෝක රාජ්‍ය සමයෙහි ශික්ෂාකාමී භික්ෂූහු විනය කර්ම සිදුකිරීමෙන් වැළකී සිටියහ. මෙම ගැටලුව විසඳීමෙහිලා අශෝක රජතුමා ගත් ප්‍රමුඛ පියවර කුමක් ද?
(1) අශෝක රජතුමා මොග්ගලීපුත්ත තිස්ස මාහිමියන්ගෙන් කරුණු විමසා බැලීමයි.
(2) විනය කර්ම කරන ලෙස රාජ නියෝගයක් නිකුත් කිරීමයි.
(3) කරුණු සොයා බැලීමට ඇමතිවරයකු පත් කිරීමයි.
(4) විනය කර්ම සිදු නො කරන්නේ නම් බුදුසසුනට රාජ්‍යානුග්‍රහය නො දීමට තීරණය කිරීමයි.
(5) ගැටලුව විසඳීමට මහ තෙරවරුන් පස්නමකගෙන් යුතු උබ්බාහිකාවක් පත්කිරීමයි.

**34.** ධර්මාශෝක අධිරාජයා බෞද්ධයකු වුව ද අනෙකුත් ආගමිකයන්ට අවශ්‍ය පහසුකම් සපයා දුන් බවත්, ආජීවකයන්ට ආරාම පූජා කළ බවත් සඳහන් වන්නේ,
(1) කාල්සි ගිරි ලිපියේ ය. (2) ගිර්නාර් ගිරි ලිපියේ ය. (3) බරාබර් ගිරි ලිපියේ ය.
(4) භාබ්‍රූ ගිරි ලිපියේ ය. (5) කන්දහාර් ගිරි ලිපියේ ය.

**35.** භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාල හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - මහල් නවයකින් හා මන්දිර තුනකින් සමන්විත පුස්තකාලයක් පැවතුණි.
B - ශ්‍රාවකයාන බුදුසමයේ කේන්ද්‍රස්ථානය විය.
C - ආකාශ වස්තු පර්යේෂණාගාරයක් තිබුණි.
D - විශ්වවිද්‍යාලය මධ්‍යයේ 'විද්‍යාගෘහ' නමින් ප්‍රධාන දේශන ශාලාවක් විය.
E - පුස්තකාල අරමුදලක් පිහිටුවා තිබුණි.
ඉහත ප්‍රකාශ අතුරින් වික්‍රමශිලා විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය තෝරන්න.
(1) A (2) B (3) C (4) D (5) E

**36.** ප්‍රාග් බෞද්ධ යුගයේදී ලක්වැසියන් දෙවියන් පිළිබඳ විශේෂ ගෞරවාදරයක් දැක් වූ බවට සාධක හමු වේ. ඒ අනුව දඩයක්කරුවන්ට අධිපති දෙවියා ලෙස පූජනීයත්වයට පත්ව ඇත්තේ,
(1) කම්මාර දෙවියා ය. (2) ව්‍යාධ දෙවියා ය. (3) පුරදේව දෙවියා ය.
(4) උපුල්වන් දෙවියා ය. (5) සුමන දෙවියා ය.

**37.** 'ප්‍රාග් මහින්ද යුගයේදී ලක්දිව බෞද්ධයන් සිටින්නට ඇතැ'යි අනුමාන කළ හැකි සාක්ෂි වංශකථා සාහිත්‍යයෙන් සොයාගත හැකි ය. මහින්දාගමනයට ආසන්නතම යුගයේදී එවැනි පිරිසක් සිටි බවට දැක්විය හැකි සාධකයක් වන්නේ,
(1) බුදුරජාණන් වහන්සේගේ ලංකාගමනයේදී විශාල පිරිසක් බෞද්ධයන් වී සිටීමයි.
(2) භද්දකච්චානා කුමරියගේ සම්ප්‍රාප්තියයි.
(3) මහාසුමන දෙවියන් ඇතුළු විශාල පිරිසක් බෞද්ධයන් වී සිටීමයි.
(4) ගිරිභණ්ඩ සෑය බෞද්ධයන් විසින් නිමවා තිබීමයි.
(5) මණිඅක්ඛික නාරජු ඇතුළු පිරිස බුදුසමය වැළඳ ගැනීමයි.



Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**38.** පහත දැක්වෙන ප්‍රකාශ හොඳින් කියවන්න.

A - පඤ්චශීල ප්‍රතිපදාවට අනුගත ව රාජ්‍ය පාලනය කළ ආමණ්ඩගාමිණී රජතුමා මාඝාත ආඥාව පැනවූයේ ය.

B - සතර සංග්‍රහ වස්තු අනුගමනය කරමින් සතර අගතියෙන් තොර ව රාජ්‍යය පාලනය කළ බුද්ධදාස රජතුමා සතුන්ට පවා වෙදකම් කොට සුවපත් කෙළේ ය.

C - අවිහිංසා ප්‍රතිපදාව අනුගමනය කළ සිරිසඟබෝ රජතුමා මරණ දණ්ඩනයට නියමවූවන්ට පවා අභය දානය දුන්නේ ය.

D - බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම අනුව රාජ්‍ය පාලනය කළ වළගම්බා රජතුමා ශාසන ශෝධනයක් සිදුකොට කතිකාවතක් පිහිටුවී ය.

E - සතර සංග්‍රහ වස්තු අනුගමනය කළ සද්ධාතිස්ස රජතුමා අනුන්ගේ කුඹුරක කුලියට වැඩකොට උපයාගත් ධනයෙන් මහා සංඝයාට දන් පූජා කෙළේ ය.

ඉහත ප්‍රකාශ අතුරින් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) A (2) B (3) C (4) D (5) E

**39.** මහසෙන් රජතුමා ලාංකික බුදුසමයේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කළ බවට සාධකයක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) ජේතවන විහාරය ඉදිකොට භික්ෂූන්ට පූජා කිරීමෙනි.
(2) විනය සංගායනාවක් පවත්වා ශාසන චිරස්ථිතිය ඇති කිරීමෙනි.
(3) ශාසන විරෝධී භික්ෂූන් හැටදෙනෙකු තෝරා වෙර ලකුණු තබා රටින් පිටුවහල් කිරීමෙනි.
(4) ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට අනුග්‍රහය දැක්වීමෙනි.
(5) රටපුරා දන්සල් විවෘත කොට භික්ෂු සංඝයාට දන්දීමෙනි.

**40.** පහතින් දැක්වෙන්නේ මහාවිහාරය හා අභයගිරිය යන ආයතන දෙක සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A - පාලි අටුවාකරණය සඳහා බුද්ධඝෝෂ හිමියන්ට පහසුකම් සැලසීම
B - විනය සංගායනාවක් පැවැත්වීම
C - දළදා වහන්සේ පිළිගෙන පුද පූජා හා පෙරහැර පැවැත්වීම
D - ලෝවා මහා ප්‍රාසාදය ශාසනික විනයකර්ම සඳහා භාවිත කිරීම
E - රත්න ප්‍රාසාදය මහානාග තෙරුන්ට පූජා කිරීම

ඉහත ප්‍රකාශ අතුරින් අභයගිරි සම්ප්‍රදායට අයත් ප්‍රකාශ දෙක ඇතුළත් වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ C (3) B සහ D (4) C සහ D (5) C සහ E

**41.** ක්‍රි.ව. 11වන සියවසේ ථෙරවාද බුදුසමය බුරුම දේශයේ ස්ථාපනය වනවිට එහි රාජ්‍ය පාලනය කරන ලද්දේ ......................... විසිනි.

(1) කෙයංසිත්ථ රජතුමා (2) අනුරුද්ධ රජතුමා (3) නරපතිසිථු රජතුමා
(4) ධම්මචේතිය රජතුමා (5) මින් දොන් මින් රජතුමා

**42.** ප්‍රාග් බෞද්ධ චීන ජන ජීවිතය හැඩ ගැස් වූ ප්‍රධාන ආගමික සම්ප්‍රදාය දෙකක් පිළිබඳ තොරතුරු දැකගත හැකි ය. එම ආගමික සම්ප්‍රදාය දෙක වන්නේ,

(1) ෂින්තෝ සහ තාඕ දහමයි.
(2) කොන්ෆියුසියස් සහ ෂින්තෝ දහමයි.
(3) තාඕ සහ සෙන් දහමයි.
(4) ෂින්තෝ සහ සෙන් දහමයි.
(5) තාඕ සහ කොන්ෆියුසියස් දහමයි.

**43.** පහත සඳහන් ප්‍රකාශ අතුරින් ජපන් බුදුසමයට අදාළ ව **නො ගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) බොන් යනු මළවුන් පිදීමේ උත්සවයකි.
(2) ජෝදෝ යනු බුදුරදුන්ගේ බුද්ධත්වය සිහිකරන උත්සවයකි.
(3) හනමත්සුරි යනු බුදුරදුන්ගේ පරිනිර්වාණය සිහිකරන උත්සවයකි.
(4) සුමිඑ යනු ජපන් සෙන් චිත්‍ර කලාවකි.
(5) ඉකෙබන යනු සෙන් බුදුදහමේ ආභාසයෙන් ඇති වූ මල් කලාවකි.

[අටවැනි පිටුව බලන්න

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

**44.** ජපානයට බුදුසමය සම්ප්‍රාප්ත වූ විට එරට පරිපාලනයට සම්බන්ධ වී සිටි සොගා වංශිකයන් බුදුසමය මහත් හරසරින් පිළිගත් අතර, මොනොනොබෙ සහ නකතොමි වංශිකයෝ බුදුසමයට එරෙහි වූහ. ඔවුහු බුදුසමය ජපානයේ ස්ථාවර වීම වැළැක්වීම සඳහා නොයෙක් උපක්‍රම යෙදූහ. කාලය ගෙවී යත් ම පළමුවරට ජපානය තුළ බුදුසමය පිළිබඳ ධනාත්මක ආකල්පයක් වර්ධනය විය. ඊට හේතු වූ කරුණ වූයේ,

(1) මොනොනොබෙ සහ නකතොමි වංශිකයන් ද බුදුසමය වැළඳ ගැනීමයි.
(2) බුදුසමයට හිරිහැර කිරීම හේතුවෙන් සමාජය තුළ වසංගත පැතිර යාමයි.
(3) බුදුසමය හේතුවෙන් මළවුන් කෙරෙහි වූ බිය පහව යාමයි.
(4) 'බුදුසමයට හිරිහැර කිරීමෙන් පැතිර ගිය වසංගතය උත්සන්න වී යැ'යි අදහසක් සමාජගත වීමයි.
(5) 'බුදුසමයට ජපන් සංස්කෘතිය දියුණු කළ හැකි යැ'යි ජපන් සමාජයෙහි විශ්වාසයක් ගොඩනැගීමයි.

**45.** බුද්ධ ප්‍රතිමාවක් නෙළීම පිණිස බුදුරදුන් ධරමාන කාලයේ ම අනේපිඬු සිටුතුමා විසින් අවසර ලබාගත් බව සඳහන් වන මූලාශ්‍රය වන්නේ,

(1) සමන්තපාසාදිකාවයි. (2) කාලිංගබෝධි ජාතකයයි. (3) මනෝරථපූරණියයි.
(4) චුල්ලවග්ගපාළියයි. (5) කෝසලබිම්බවර්ණනාවයි.

**46.** පොළොන්නරු ගල්විහාරයෙහි ඇති හිඳි පිළිමය පිළිබඳ අදහස් දක්වන ආචාර්ය ආනන්ද කුමාරස්වාමි එහි ආසනය .......................... යනුවෙන් හඳුන්වයි.

(1) පද්මාසනය (2) වීරාසනය (3) භද්‍රාසනය (4) වජ්‍රාසනය (5) ස්වස්තික ආසනය

**47.** 'බුදු, පසේබුදු, මහරහත් සහ සක්විතිරජු යන ථූපාරහ පුද්ගලයින් සඳහා ස්තූප නිර්මාණය කළ යුතු යැ'යි බුදුරදුන් අනුදැන වදාළ දේශනාව ඇතුළත් වන්නේ,

(1) මහාපරිනිබ්බාණ සූත්‍රයේ ය. (2) මහාපදාන සූත්‍රයේ ය.
(3) ලක්ඛණ සූත්‍රයේ ය. (4) පබ්බජ්ජා සූත්‍රයේ ය.
(5) මහානිදාන සූත්‍රයේ ය.

**48.** සඳකඩපහණ සහ එහි ඇති කැටයම් පිළිබඳ විවිධ විද්වතුන් මත පළ කර තිබේ. ඒ අනුව 'සඳකඩපහණ ගොඩනැගිලි දොරටු සැරසීමට යොදාගත් උපායක් හා පාදෝනියක් ලෙස දැක්විය හැකි ය.' යන අදහස ඉදිරිපත් කරන ලද්දේ,

(1) සෙනරත් පරණවිතාන විසිනි. (2) එච්. සී. පී. බෙල් විසිනි.
(3) ඩී. ටී. දේවේන්ද්‍ර විසිනි. (4) විනී විතාරණ විසිනි.
(5) විලියම් ඊ. වෝඩ් විසිනි.

**49.** ආමිස හා ප්‍රතිපත්ති යන පූජාවන්ගෙන් පුදසත්කාර ලැබීමට බුදුරදුන් සුදුසු වනබව විස්තර කරමින් රචිත කෘතිය පූජාවලියයි. එම ග්‍රන්ථයේ කතුවරයා වන්නේ,

(1) බුද්ධපුත්‍ර හිමියන් ය. (2) විද්‍යාචක්‍රවර්ති ය.
(3) දෙවන පරාක්‍රමබාහු රජු ය. (4) ධර්මසේන හිමියන් ය.
(5) ගුරුළුගෝමී පඬිතුමා ය.

**50.** බෞද්ධ සිතුවම් කලාවට අදාළ ව පහත දක්වා ඇති ප්‍රකාශ අවධානයෙන් කියවන්න.

A - බුද්ධ, ධම්ම, සංඝ යන ත්‍රිවිධ රත්නය පිළිබඳ ශ්‍රද්ධාව හා භක්තිය ඇති කිරීම
B - සමාජයට දහම් පණිවුඩයක් ලබාදීම
C - සමාජයට උපදේශයක් ලබාදීම
D - අකුරු නො දත් ගැමි ජනතාවට බණකතා කියා දී සිතුවම් මගින් ඒවා අවබෝධ කර ගැනීමට සැලැස්වීම
E - ශාසනික හා ඓතිහාසික වශයෙන් වැදගත් පුවත් පිළිබඳ අවබෝධයක් ලබාදීම

ඉහත සඳහන් ප්‍රකාශ අතුරින් බෞද්ධ සිතුවම් කලාවෙන් අපේක්ෂිත අරමුණු වැඩි ම ගණනක් ඇතුළත් වරණය තෝරන්න.

(1) A (2) A සහ B
(3) A, B සහ C (4) A, B, C සහ D
(5) A, B, C, D සහ E යන සියල්ල ම

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

බෞද්ධ ශිෂ්ටාචාරය II
பௌத்த நாகரிகம் II
Buddhist Civilization II

45 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

※ **I කොටසින්** ප්‍රශ්න **දෙකක්** ද, **II කොටසින්** ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** (i) බ්‍රාහ්මණ ඉගැන්වීම්වල දැක්වෙන චතුර්විධ ආශ්‍රම ධර්ම නම් කරන්න. (ලකුණු 02යි.)

(ii) චතුර්විධ ආශ්‍රම ධර්මයන්ගේ පළමුවැන්න හඳුන්වා දෙන්න. (ලකුණු 03යි.)

(iii) බුදුරජාණන් වහන්සේ සහ වජ්ජි රාජ්‍යය අතර පැවති සබඳතා සාධක **තුනක්** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)

(iv) සංජය බෙල්ලට්ඨිපුත්තගේ අමරාවික්ඛේපවාදය පිළිබඳ ප්‍රමාණවත් විවරණයක් කරන්න. (ලකුණු 05යි.)

(v) මානව වර්ගයාගේ ඒකත්වය බෞද්ධ ඉගැන්වීම් මගින් තහවුරු කොට ඇති ආකාරය ප්‍රමාණවත් සාධක ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

**2.** (i) බුදුරජාණන් වහන්සේගේ සම්මාසම්බුද්ධ ගුණය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 02යි.)

(ii) නකුලමාතා චරිතයෙන් වර්තමාන සමාජයට ලබාගත හැකි ආදර්ශ **තුනක්** සැකෙවින් දක්වන්න. (ලකුණු 03යි.)

(iii) බෞද්ධ ආර්ථික දර්ශනයෙහි එන සමජීවිකතාව ප්‍රමාණවත් ව පැහැදිලි කරන්න. (ලකුණු 04යි.)

(iv) චතුර්විධ සුඛය නම් කොට එහි පළමුවැන්න විස්තර කරන්න. (ලකුණු 05යි.)

(v) බුදුරදුන් ප්‍රකට කළ ආගමික සහනශීලී ගුණය වර්තමාන ආගමික ගැටුම් නිරාකරණයෙහිලා ආදර්ශ කොට ගත හැකි අයුරු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06යි.)

**3.** (i) "යෝ බාලෝ මඤ්ඤති බාල්‍යං" යන ධම්මපද ගාථාව නිවැරදි ව සම්පූර්ණ කරන්න. (ලකුණු 02යි.)

(ii) ඉහත 3 (i) හි සඳහන් ගාථාවේ අර්ථය නිවැරදි ව ලියා දක්වන්න. (ලකුණු 03යි.)

(iii) සිගාලෝවාද සූත්‍රයට අනුව කුලපුත්‍රයා විසින් මිතුරන්ටත්, මිතුරන් විසින් කුලපුත්‍රයාටත් ඉටුකළ යුතු යුතුකම් හා වගකීම් **දහය** නම් කරන්න. (ලකුණු 04යි.)

(iv) පාපමිත්‍ර සේවනය පුද්ගල ජීවිතයේ පරිහානියට හේතුවන අයුරු බෞද්ධ ඉගැන්වීම් අනුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05යි.)

(v) "මවුපියන්ට උපස්ථාන කිරීම මංගල කරුණක් ලෙස මංගල සූත්‍රය අවධාරණය කරයි."
වර්තමාන සමාජ තත්ත්වයට සාපේක්ෂ ව ඉහත ප්‍රකාශයෙහි වැදගත්කම අවධාරණය කරන්න. (ලකුණු 06යි.)

[ දෙවැනි පිටුව බලන්න.

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/

## II කොටස

**4.** (i) "ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ආකල්පය සමාජ සහජීවනයට මග පාදයි." ප්‍රමාණවත් සාධක මගින් සනාථ කරන්න. (ලකුණු 10යි.)

(ii) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව කෙටියෙන් දක්වා මත් උවදුර පිටුදැකීමට බෞද්ධ ඉගැන්වීම්වලින් ලබාගත හැකි පිටිවහල ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

**5.** (i) ත්‍රිවිධ ධර්ම සංගායනා සඳහා නායකත්වය දුන් මහතෙරවරුන්ගේ සේවය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි.)

(ii) බුදුසසුනේ චිරස්ථිතිය උදෙසා පවත්වන ලද ධර්ම සංගායනා විෂයයෙහි භාරතීය රජවරුන්ගෙන් ලද අනුග්‍රහය ප්‍රමාණ කරන්න. (ලකුණු 10යි.)

**6.** (i) ජපන් සංස්කෘතියේ පෝෂණයට බුදුසමයෙන් ලද ආභාසය නිදසුන් සහිත ව ඉදිරිපත් කරන්න. (ලකුණු 10යි.)

(ii) චීන බුදුසමයේ සංවර්ධනය සඳහා ඉන්දු-චීන භික්ෂූන්ගෙන් ඉටු වූ මෙහෙය අගයන්න. (ලකුණු 10යි.)

**7.** (i) ශ්‍රී ලාංකේය ජනකවි හා ගීත කලාවේ පෝෂණයට බෞද්ධ ඉගැන්වීම්වලින් ලද ආභාසය විමර්ශනය කරන්න. (ලකුණු 10යි.)

(ii) අනුරාධපුර මහාවිහාරය ථෙරවාද බුදුසමයේ කේන්ද්‍රස්ථානය වූ බව ප්‍රමාණවත් සාධක මගින් සනාථ කරන්න. (ලකුණු 10යි.)

**8.** (i) බුද්ධ ප්‍රතිමා නිර්මාණයට පෙර බුදුරදුන් වෙනුවට භාවිත කරන ලද සංකේත ගෙනහැර දක්වා, බුද්ධ ප්‍රතිමා කලාවේ ආරම්භය පිළිබඳ ප්‍රමාණවත් සාකච්ඡාවක් කරන්න. (ලකුණු 10යි.)

(ii) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකකට** ප්‍රමාණවත් විස්තර සපයන්න.

(1) බුද්ධ ප්‍රතිමාවේ ආසන

(2) වටදාගෙය

(3) සතර සංග්‍රහ වස්තු

(4) නාලන්දා විශ්වවිද්‍යාලය (ලකුණු 05× 2 = 10යි.)

* * *

Download all Past Papers> https://bookbeekid.com/resource/past-papers/
0009212